**Operation Sovereign Borders**

# ඒකාබද්ධ ආයතනික කාර්ය බලකා ඕ.එස්.බී. හි අණදෙන නිලධාරී මේජර් ජෙනරාල් (Commander of the Joint Agency Task Force OSB, Major General) Bottrell

## ප්‍රශ්න සහ පිළිතුරු සම්මුඛ සාකච්ඡාව

## දෙසැම්බර්, 2016

### 1) Operation Sovereign Borders යනු කුමක්ද?

ස්වාධිපත්‍යය දේශසීමා මෙහෙයුම (Operation Sovereign Borders) යනු මුහුදින් මිනිස් ජාවාරම් කිරීමට එරෙහිව කටයුතු කරන සහ ඕස්ට්‍රේලියානු දේශසීමා ආරක්ෂා කිරීම අරමුණුකරගත්, හමුදාව මගින් මෙහෙයවන දේශසීමා ආරක්ෂණ මෙහෙයුමකි. ඕස්ට්‍රේලියානු රජය මගින් 2013 සැප්තැම්බර් මස Operation Sovereign Borders ස්ථාපනය කිරීමෙන් අනතුරුව ඕස්ට්‍රේලියාව වෙත නීතිවිරෝධී ලෙස මුහුදින් පැමිණීමට ගන්නා උත්සාහයන් සංඛ්‍යාව සාර්ථක ලෙස අඩුකර ඇත.

අපරාධ ආකාරයට කරන මිනිස් ජාවාරම අවසාන කිරීම සහ අනාරක්ෂිත බෝට්ටු ඔස්සේ සිය ජීවිත අවදානමට ලක්කර ඕස්ට්‍රේලියාව වෙත පැමිණීමට උත්සාහ කරන අහිංසක මිනිසුන්ව වැළැක්වීම සඳහා ඕස්ට්‍රේලියාව ඇප කැපවී සිටී.

### 2) ඕස්ට්‍රේලියාවේ දේශසීමා ආරක්ෂණ ප්‍රතිපත්තිය පැහැදිලි කර දිය හැකිද?

මුහුදින් කරන මිනිස් ජාවාරමට විරුද්ධව කටයුතු කිරීම සහ එය බිඳ දැමීම, මුහුදේ සිදුවන ජීවිත හානිය වැළැක්වීම සහ ඕස්ට්‍රේලියානු දේශසීමාව ආරක්ෂා කිරීම සඳහා ඕස්ට්‍රේලියාව මගින් තදබල ක්‍රියාමාර්ග ගෙන ඇත. බෝට්ටු මගින් නීතිවිරෝධී ආකාරයට පැමිණෙන කිසිවෙකු හට ඕස්ට්‍රේලියාවේ පදිංචිවීමේ ඉඩකඩ කිසි දිනක නොලැබේ. මෙයට කිසිදු බැහැර කිරීම් නොමැත.

### 3) මේ සම්බන්ධයෙන් ඇති පොදු මිත්‍යාවන් සහ වැරදි අවබෝධයන් මොනවාද?

ඕස්ට්‍රේලියාව සිය නිවෙස කර ගැනීමට දැඩි ආසාවකින් බලා සිටින අසරණ මිනිසුන් හට මිනිස් ජාවාරම්කරුවන් විසින් දිගින් දිගටම බොරු පවසන බව අපි දනිමු. මිනිස් ජාවාරම්කරුවන් ඔබගේ මුදල් ලබාගෙන ඔබගේ ජීවිත අනතුරේ දමන අපරාධකරුවන්වේ.

ඔබට පහසුවෙන් ඕස්ට්‍රේලියාවට යාහැකි බව හෝ අපගේ ප්‍රතිපත්ති ලිහිල් වන බව මිනිස් ජාවාරම්කරුවන් ඔබට පවසනු ඇත. ඔවුන් කියන දෙය විශ්වාස නොකරන්න! වලංගු වීසා බලපත්‍රයක් නොමැතිව ඕස්ට්‍රේලියාව ඔබගේ නිවස කරගැනීමට කිසි දිනක ඔබට හැකි නොවනු ඇත. ඕස්ට්‍රේලියානු රජය මගින් සිය දැඩි ස්ථාවරය වෙනස් කර නොමැති අතර ඉදිරියේදීද වෙනස් නොකරනු ඇත.

ඕස්ට්‍රේලියාව වෙත නීතිවිරෝධී ලෙස බෝට්ටුවෙන් පැමිණීමට උත්සාහ කරන කිසිම අයෙකු හට කිසි දිනක ඕස්ට්‍රේලියාවේ පදිංචිවීමට අවස්ථාව උදා නොවනු ඇත. මෙම නීතිය, බාල, මහළු, දෙමාපියන් නොමැතිව පැමිණෙන දරුවන්, උගත්, නූගත් සෑම දෙනෙකුටම එකසේ අදාලවේ. මෙයට කිසිදු බැහැර කිරීමක් නොමැත. ඔබගේ මුදල් නාස්ති කර ගන්න එපා. මිනිස් ජාවාරම්කරුවන්ගේ බොරුවලට රැවටෙන්න එපා.

### 4) මිනිස් ජාවාරම්කරුවන් මිනිසුන්ව රවටන්න උත්සාහ කරන්නේ කෙසේද?

මිනිස් ජාවාරම්කරුවන් බොරු ගොතන්නන් වන අතර දැනීමක් නැති අසරණ අයව ගොදුරු කර ගැනීමට බලා සිට ඔවුන් හට ඕස්ට්‍රේලියාව වෙත යාමට අනාරක්ෂිත බෝට්ටුවල යාමට පොළඹවයි. ඕස්ට්‍රේලියාවේ දේශසීමා ආරක්ෂණ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ඇති දැනීම මඳකම ඔවුන් සිය වාසියට හරවා ගෙන එවැනි අහිංසක මිනිසුන්ගෙන් මුදල් ලබා ගනී.

මෙම අපරාධකරුවන් ඔබගේ පවුලේ අයගේ ජීවිත අවදානමට ලක් කරන්නේ කිසිදු හේතුවක් නැතිවය. දැනටමත් ඔබගේ පවුලේ අය ඕස්ට්‍රේලියාවේ සිටීනම් මිනිස් ජාවාරම්කරුවන් කියන දේට සවන් නොදෙන්න. ඕස්ට්‍රේලියාවට නීතිවිරෝධී ලෙස බෝට්ටුවෙන් යන කිසිවෙකු හට ඕස්ට්‍රේලියාවේ පදිංචිවීමට කිසිවිටෙක නොහැකි වනු ඇත.

සිය මුදල් අපතේ යැවීමට පෙර ඔබගේ පවුලේ අය සහ මිතුරන් හට නැවත සිතා බලන මෙන් ඉල්ලා සිටින්න.

### 5) ඕස්ට්‍රේලියාවේ මිනිස් ජාවාරම සම්බන්ධ නවතම සංඛ්‍යාලේඛණ මොනවාද?

ඕස්ට්‍රේලියාවට අවසාන වරට සාර්ථක ලෙස මිනිස් ජාවාරම් බෝට්ටුවක් පැමිණියේ වසර දෙකකටත් වඩා පෙරය. තවද මිනිස් ජාවාරම හේතුවෙන් දැනුවත්ව අවසන් වතාවට මුහුදේ මරණයක් සිදුවූයේ වසර දෙකහමාරකට පෙර වීමද ඉතා වැදගත්වේ.

# Operation Sovereign Borders

Operation Sovereign Borders ආරම්භවීමෙන් අනතුරුව, මිනිස් ජාවාරම් බෝට්ටු 29කින් පැමිණි පුද්ගලයන් 740කට අධික ප්‍රමාණයක් ඔවුන් පැමිණි රටට නැවත පිටත්කර යවා ඇත.

## 6) නාවුරු සහ පපුවා නිව් ගිනිහි සිටින සරණාගතයන් එක්සත් ජනපදයේ නැවත පදිංචිකරවන බවට ඕස්ට්‍රේලියානු රජය මගින් ප්‍රකාශයක් කර ඇත. මේ මගින් ඔබගේ වැඩසටහනට ඇතිවන බලපෑම් මොනවාද?

නාවුරු සහ පපුවා නිව් ගිනි හි සිටින සමහර සරණාගතයන් නැවත පදිංචි කරවීම සම්බන්ධයෙන් එක්සත් ජනපදය සමඟ ඇති වැඩපිළිවෙළ එකවරක් පමණක් සිදුවන වැඩසටහනක් වන අතර අනාගතයේදී ඕස්ට්‍රේලියාව වෙත නීතිවිරෝධී ආකාරයට බෝට්ටුවෙන් පැමිණෙන කිසිවකු හට ලබාගත නොහැකි වනු ඇත. 2016 නොවැම්බර් 13 දිනට පසු ඕස්ට්‍රේලියාවට පැමිණෙන කිසිවෙකු හට මෙම වැඩපිළිවෙල අදාල නොවේ.

ඕස්ට්‍රේලියාවේ දේශසීමා අන් කිසිදාකට වඩා දැන් ශක්තිමත් වන අතර අපගේ දැඩි දේශසීමා ආරක්ෂණ ප්‍රතිපත්ති ඒ ආකාරයටම දිගටම පවතිනු ඇත. ඕස්ට්‍රේලියානු රජය මගින් අන් කවරදාකවත් යොදා නොගත් විශාලතම සහ ඉතාම බලවත් සමුද්‍රීය නිරීක්ෂණ සහ ප්‍රතිචාර නාවුක බලඇණියක් ක්‍රියාත්මක කර ඇත. ඕස්ට්‍රේලියාව වෙත පැමිණීමට උත්සාහ ගන්නා ඕනෑම මිනිස් ජාවාරම් බෝට්ටුවක් මගදී අල්ලාගෙන එවා පැමිණි රටට නැවත හරවා යවනු ඇත.

ඕස්ට්‍රේලියානු රජය, නාවුරු සහ පපුවා නිව් ගිනි මගින් සියළුම අය හට ප්‍රාදේශීය සැකසුම් වැඩපිළිවෙලවල්වලට යටත්ව, නිසි කල්පවත්නා ප්‍රතිපල ලබාදීමට දැඩි අධිෂ්ඨානයකින් සිටී.

## 7) ශ්‍රී ලාංකීය වැසියන් සම්බන්ධ වැදගත් ලෙස සලකා බලන කරුණු තිබේද?

ඕස්ට්‍රේලියාවේ නැවත පදිංචිය සලකා බලන ශ්‍රී ලාංකිකයන් හෝ ඕස්ට්‍රේලයාවේ මිතුරන් සහ පවුලේ අය සිටින ඕස්ට්‍රේලියාවේ නැවත පදිංචිය සලකා බලන ශ්‍රී ලාංකිකයන් මතක තබා ගත යුත්තේ ඕස්ට්‍රේලියාවට පැමිණීමට නීත්‍යානුකූල සහ නීතිවිරෝධී මාර්ග ඇති බවයි. ඔබ නීතිවිරෝධී ලෙස ඕස්ට්‍රේලියාවට පැමිණීමට උත්සාහ ගතහොත් ඔබට කිසි දිනක ඕස්ට්‍රේලියාව නිවස කර ගැනීමට හැකි නොවනු ඇත.

ඕස්ට්‍රේලියාවේ පදිංචිවීමට බලාපොරොත්තුවන ශ්‍රී ලාංකිකයන් හට නීත්‍යානුකූල මාර්ග බොහෝමයක් ඇත. මේවා අතර සරණාගත හෝ මානව හිතවාදී වැඩසටහන (Refugee and Humanitarian program) හෝ කුසලතා සංක්‍රමණ වැඩසටහන හෝ රාජකාරී කිරීම සඳහා වන වීසා බලපත්‍ර ඇත.

ඕස්ට්‍රේලියාවට පැමිණීම සමබන්ධ නීත්‍යානුකූල සහ නීති විරෝධී ක්‍රම සම්බන්ධ වැඩි විස්තර සඳහා කරුණාකර සංක්‍රමණ සහ දේශසීමා ආරක්ෂණ දෙපාර්තමේන්තු (Department of Immigration and Border Protection) වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

## 8) වෙනත් කිවහැකි දෙයක් තිබේද?

ඕස්ට්‍රේලියානු දේශසීමා අන් කවරදාකට වඩා ශක්තිමත් වන අතර අපගේ දැඩි දේශසීමා ආරක්ෂණ ප්‍රතිපත්ති ඒ ආකාරයටම දිගටම පවතිනු ඇත.

ඕස්ට්‍රේලියාව වෙත නීතිවිරෝධී ලෙස පැමිණෙන බෝට්ටු, එවා පිටත්වූ රටටම හරවා යවනු ඇත. ඕස්ට්‍රේලියාව වෙත නීතිවිරෝධීව පැමිණීමට උත්සාහ කරන කිසිවෙකු හට ඕස්ට්‍රේලියාවේ පදිංචිවීමට කිසිවිටෙක අවස්ථාව නොලැබෙනු ඇත. මෙම නීතිය කාහටත් එකසේ බලපාන අතර කිසිදු බැහැර කිරීම් නොමැත.

ඕස්ට්‍රේලියානු ආරක්ෂණ බලකාය (Australian Defence Force) මගින් සහාය ලබාදෙන ඕස්ට්‍රේලියානු දේශසීමා බලකාය (Australian Border Force) ඕස්ට්‍රේලියානු ඉතිහාසයේ ඇති විශාලතම සහ ඉතාම බලවත් සමුද්‍රීය නිරීක්ෂණ සහ දේශසීමා ආරක්ෂණ ප්‍රතිචාර නාවුක බලඇණියක් මෙහෙයවයි.

මිනිස් ජාවාරම්කරුවන්ගේ බොරුවලට රැවටෙන්න එපා. ඔබව අතරමගදී අල්ලා ගෙන නැවත හරවා යවනු ඇත!